# පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණය - 2019

ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂික ව සැලසුම් කරනු ලබන පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීමේ සම්මන්ත්‍රණය 2019 දෙසැම්බර් මස 6 යන දින පැවැත්වීමට සැලසුම් කර තිබේ.

අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීමේ කර්තව්‍යයෙහි ලා පුරෝගාමී ව කටයුතු කරන, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදක තලයේ සිට ක්‍රියාත්මක තලය දක්වා වූ විවිධ ස්තර නියෝජනය කරන පාර්ශ්ව සහ ආයතනවල අධ්‍යාපන පර්යේෂණයන්හි නිරත වූ පර්යේෂකයන්ට, පර්යේෂණ සහ පර්යේෂණානුබද්ධ ක්‍රියාකාරකම් ආශ්‍රිත ආනාවරණ ඉදිරිපත් කිරීම සඳහා සම්මන්ත්‍රණය විවෘත ය.

පර්යේෂණ අනාවරණ ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පර්යේෂකයින් තම පර්යේෂණය පිටු තුනකට සීමාවන පරිදි පිළියෙල කළ ව්‍යාපනය කරන ලද සංක්ෂිප්තයක් (Extended Abstract) සහ පිටුවකට සීමා වන පරිදි සැකසු විධායක සංක්ෂිප්තයක් (Executive Summary) 2019.06.30 දිනට පෙර අධ්‍යක්ෂ, පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම. යන ලිපිනයට එවිය යුතු ය.

සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමේ දී මේ සමඟ ඇති විස්තර පත්‍රිකාවේ සඳහන් නිර්ණායක අනුව පිළියෙල කර එවීම අනිවාර්ය වේ.

ආචාර්ය ටී. ඒ. ආර්. ජේ. ගුණසේකර  
අධ්‍යක්ෂ ජනරාල්

විමසීම්:

1. ආචාර්ය දයානන්ද කැප්පෙටිගොඩ - අධ්‍යක්ෂ (පර්යේෂණ)වැ.ආ. - 011-7601785
2. දිල්හානි හෙට්ටිගේ - කථිකාචාර්ය - 011-7601794

**පර්යේෂණ සංක්ෂිප්ත සැකසීම සඳහා නිර්ණායක**

පර්යේෂණ සංක්ෂිප්තය සිංහල, දෙමළ හෝ ඉංග්‍රිසි භාෂාවලින් ඉදිරිපත් කළ හැකි ය. A4ප්‍රමාණයේ තනි පැත්ත කොළය භාවිත කළ යුතු අතර වාක්‍ය අතර පරතරය (Line space) පොයින්ට් එකහමාරක් (1.5) විය යුතු ය. පර්යේෂණ සංක්ෂිප්තය A4 ප්‍රමාණයේ පිටුවකට සීමා විය යුතු ය. පර්යේෂණ සංක්ෂිප්තයේ ඉහළින්, පහළින් සහ දකුණු පසින් අගල් 1ක පරතරයක් ද වම්පසින් අගල් 1.5ක පරතරයක් ද තැබිය යුතු ය.

අක්ෂර වර්ගය (Font )

- සිංහල - එෆ්.එම්. අභය (FM Abhaya )
- දෙමළ - කලහම් ( Kalaham)
- ඉංග්‍රිසි - ටයිම්ස් නිව් රෝමන් (Times New Roman )

අක්ෂරයෙහි ප්‍රමාණය (Font size )

- ප්‍රධාන මාතෘකාව සඳහා අක්ෂරයේ ප්‍රමාණය 14 ( 14pt ) කි
- පෙළෙහි (Text ) අක්ෂරයේ ප්‍රමාණය 12 (12pt ) කි.
- ප්‍රධාන මාතෘකා තද පැහැයෙන් (Bold ) දැක්විය යුතු ය.

පර්යේෂණ සංක්ෂිප්තය සමග පහත සඳහන් විස්තර අනුපිළිවෙලින් සපයන්න.
පර්යේෂණ සංක්ෂිප්තයේ මාතෘකාව
පර්යේෂක / පර්යේෂක යන්
රාජකාරි ලිපිනය සහ පෞද්ගලික ලිපිනය
විද්‍යුත් ලිපිනය හා /හෝ දුරකථන අංකය
පර්යේෂණ සංක්ෂිප්තය
මූලික වදන් (|Key words ) උපරිම තුනකි.

ඉහත නිර්ණායකවලට අනුගත ව සැකසු පර්යේෂණ සංක්ෂිප්තයේ මෘදු පිටපතක් (Soft copy) dilhaniebirder@yahoo.com යන විද්‍යුත් ලිපිනයට ද පර්යේෂණ සංක්ෂිප්තයේ දෘඩ පිටපතක් (Hard copy) අධ්‍යක්ෂ- පර්යේෂණ සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම යන ලිපිනයට 2019. 06. 30 දිනට පෙර එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහළින් "පර්යේෂණ අනාවරණ ප්‍රචලිත කිරීම-2019" යනුවෙන් සටහන් කළ යුතුය.